Australian Government

Department of Immigration and Border Protection

# ප්‍රාදේශීය සහයෝගීතාව මගින් දේශසීමා ආරක්ෂා කෙරේ

රෙඩ්බැක් අභ්‍යාසය (Exercise Redback) නම්වූ සහයෝගීතාවයෙන් නීති බලාත්මක කරන පුහුණු අභ්‍යාසයක් මගින් සමුද්‍රික අපරාධවලට එරෙහිව ශක්තිමත්ව එකට කටයුතු කිරීම සඳහා ඕස්ට්‍රේලියාව සහ මැලේසියාව එක්ව කටයුතු කෙරේ.

Exercise Redback යනු මිනිස් ජාවාරම සහ මිනිසුන් එහා මෙහා ගෙනයාම ඇතුළු සමුද්‍රික අපරාධවලට එරෙහිව රටවල් දෙකෙහිම හැකියාවන් දියුණු කිරීම සඳහා සැලසුම් කර ඇති දිගින් දිගටම කරගෙන යන සහයෝගීතාවයෙන් නීති බලාත්මක කරන පුහුණු අභ්‍යාසයවල කොටසකි.

Exercise Redback හි කොටසක් වශයෙන්, Australian Border Force Cutter *Ocean Shield* සහ එහි කාර්ය මණ්ඩලය මැලේසියව වෙත ගමන් කල අතර එහිදී ඔවුන් මැලේසියාවේ වෙරළාරක්ෂක භටයන් (Malaysia Coast Guard (MCG)) සමඟ එක්ව නාවුක විෂයට හසුවන දැනුවත්කිරීම්, යාත්‍රාවලට ගොඩවීම සහ සෝදිසි කිරීම, සෝදිසි කිරීම සහ මුදවා ගැනීම, ගිනිනිවීම සහ මුහුදේ ජීවිත ආරක්ෂාකර ගැනීමට සූදානම්වීම ආදී අභියෝගාත්මක පුහුණු කටයුතුවල නිරත විය.

මැලේසියාවේ පිනැන්ග්හි පැවති උත්සවය අවසානයේ කථා කරමින් ඕස්ට්‍රේලියානු Maritime Border Command රෙයාර් අද්මිරාල් (Rear Admiral), Peter Laver, සමුද්‍රික නීති බලාත්මක කරන ආයතන කලාපීය වශයෙන් එක්ව කටයුතු කිරීමේ වැදගත්කම සහ වටිනාකම පැහැදිලි කරන ලදී.

“අප අද ජීවත්වන්නේ නව ආරක්ෂක ගැටළු සමග දිගින් දිගටම වෙනස්වන, සංකීර්ණ, අභියෝගාත්මක නාවුක තර්ජන ඇති පරිසරයකය. ජාත්‍යන්තර දේශසීමා හරහා ඇති සහයෝගීතාවයේ හෝ සම්බන්ධීකරණයේ අඩුපාඩුවක් අයුතු ලෙස භාවිතා කරන්නේ කුමන අවස්ථාවේද යන්න මිනිස් ජාවාරම්කරුවන්, නීතිවිරෝධී ලෙස මසුන් මරන්නන්, මත්කුඩු ජාවාරම්කරුවන් සහ මුහුදු කොල්ලකරුවන් ඕනෑකමින් බලා සිටී. Exercise Redback වැනි පුහුණු අභ්‍යාස, අධිකරණ බල සීමාවන් අතර සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීමට උපකාරී වන අතර කරදර බාධා නොමැති ආකාරයට ජාතීන් අතර බලාත්මක රාමුවක් සඳහා උපකාර ලබාදේ,” යන්න ඔහු පැවසීය.

ස්වාධිපත්‍ය දේශසීමා මෙහෙයුමේ (Operation Sovereign Borders) එයාර් වයිස් මාර්ෂල් (Air Vice-Marshal) Stephen Osborne කියා සිටියේ මැලේසියා වෙරළාරක්ෂක භටයන් (Malaysia Coast Guard) සහ අපගේ කලාපයේ වෙනත් නීතිය බලාත්මක කරන ආයතන අතර ඇති ශක්තිමත් සම්බන්ධතාවය මිනිස් ජාවාරමට එරෙහිව ඕස්ට්‍රේලියාවේ ඇති බහු-ස්ථර ප්‍රවේශයේ වැදගත් අංගයක් බවය.

“ජාත්‍යන්තර නීති බලාත්මක කරන පර්ශවකරුවන් සමඟ අපගේ ඇති සහයෝගීත්වය හේතුවෙන් මිනිස් ජාවාරම් ව්‍යාපාර ගණනාවක් කඩාකප්පල් කිරීමට හැකිවූ අතර මිනිස් ජාවාරම් කටයුතුවල නිරතවන සිය ගණනක් පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමට හැකිවිය,” යන්න ඔහු පැවසීය.

“අපගේ පිරික්සුම් සහ මුහුදේ ප්‍රතිචාර දැක්වීමට හැති හැකියාව සමඟින් අපගේ කලාපීය නීති බලාත්මක කරන හවුල්කරුවන්ගේ සහයෝගීතාවය ඇතිව ඕස්ට්‍රේලියාවට නීතිවිරෝධී ලෙස බෝට්ටුවෙන් පැමිණීමට උත්සාහ කරන කිසිවෙකු හට එය සපුරා ගැනීමට නොහැකි වන බවට අපි දිගින් දිගටම වග බලා ගන්නෙමු.

“ඕස්ට්‍රේලියාව වෙත නීතිවිරෝධීව පැමිණීමට ඇති මාර්ගය වසා ඇති අතර, එය දිගටම එසේ වසා තබනු ඇත.”

වැඩිදුර විස්තර සඳහා www.osb.border.gov.au වෙබ්අඩවිය වෙත පිවිසෙන්න.